// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2058/48 - 2018 පෙබරවාරි මස 16 වැනි සිකුරාදා - 2018.02.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පිරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

*මගේ අංකය* : BD/UP/LND.1/UO/1/10/03.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4/3/9/2011/IR/07.

උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ අවතැන් වූවන් පදිංචි කිරීම සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම්/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:*

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ ඌව පරණගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දෙහිවිනි පළාත කෝරළේ පහළ කොටවෙර ග්‍රාම නිලධාරී වසමෙහි, පහළ කොටවෙර අවසාන ගම් සිතියම් අංක 388 අතිරේක අංක 20 හි පත්‍ර අංක 21 දරන ඉඩම් කැබලි 06 සඳහා පිළියෙල කරන ලද 2017.10.31 දිනැති මූලික පිඹුරේ දක්වා ඇති හෙක්ටයාර් 0.2254 ක් වූ පහත සඳහන් නම් වලින් හා ප්‍රමාණ වලින් යුතු ඉඩම් කැබලිවලට මායිම් :

1. කැබලි අංක 837
ඉඩමේ නම: බඩල්දෙකේකුඹුර; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: වැලිමඩ පහළ කොටවෙර "සුරම්‍ය හි පදිංචි ඩී. එම්. රංජනී දිසානායක මිය; ප්‍රමාණය: හෙක්: 0.0149.

2. කැබලි අංක 838
ඉඩමේ නම: බඩල්දෙකේකුඹුර; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: වැලිමඩ පහළ කොටවෙර, ඇල්පිටවත්ත හි පදිංචි එච්. එම්. නිමල් හේරත් මයා; ප්‍රමාණය: හෙක්: 0.0553.

3. කැබලි අංක 839
ඉඩමේ නම: බඩල්දෙකේකුඹුර; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: වැලිමඩ පහළ කොටවෙර, "ගීතාණි" හි පදිංචි කේ. එම්. අප්පුහාමි මයා; ප්‍රමාණය: හෙක්: 0.0367.

4. කැබලි අංක 840
ඉඩමේ නම: බඩල්දෙකේකුඹුර; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: වැලිමඩ පහළ කොටවෙර "ගීතාණි" හි පදිංචි එච්. ජී. නන්දනී මිය; ප්‍රමාණය: හෙක්: 0.0201.

5. කැබලි අංක 841
ඉඩමේ නම: ඉද්දමල්ලැවේකුඹුර; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: වැලිමඩ පහළ කොටවෙර, හි පදිංචි එච්. එම්. සමන්ත හේරත් මයා; ප්‍රමාණය: හෙක්: 0.0503.

6. කැබලි අංක 842
ඉඩමේ නම: ඉද්දමල්ලැවේකුඹුර; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: වැලිමඩ පහළ කොටවෙර, හි පදිංචි ආර්. එම්. ආරියලතා මිය; ප්‍රමාණය: හෙක්: 0.0481.


මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවටය හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම එකී හිමිකම්, අයිතිවාසිකම් හෝ සම්බන්ධකම් ඉදිරිපත් කිරීම පිණිස තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය පැවරුණු අයවලුන් හෝ පහත සඳහන් දිනයන්හි ඒ ඒ ඉඩම් කැබලි අංක සඳහා පහත නියම කර ඇති වෙලාවට ඌවපරණගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි :

| දිනය | වේලාව | කැබලි අංක |
|---|---|---|
| 2018.03.12 | පෙ.ව. 9.30 | 837 සිට 842 දක්වා |

තව ද, 2018 මාර්තු මස 12 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම,ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයෙන් එකී ඉඩම් පරවශ්‍යතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරයක් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ජේ. එම්. චමිල ඉන්දික ජයසිංහ,
ප්‍රාදේශීය ලේකම්
ඌවපරණගම.

2018 පෙබරවාරි මස 12 වැනි දින,
ඌවපරණගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

03-169

## ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : THI/LND/L2/ACQVI/132.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/6/2015/HW/267.

තිහගොඩ ප්‍රාදේශීය ලේකම් උමේෂා සුරංගි මාතරගේ වන මම දක්ෂිණ අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ අතුරු මාර්ග ඉදිකිරීමට අදාළව නිකුත් කරන ලද 2017.11.20 දිනැති අංක 2046/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* 6A පිටුවෙහි ප්‍රකාශයට පත් කරන ලද 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 7 වන වගන්තිය යටතේ *ගැසට් නිවේදනයේ* සඳහන් වන්දි පරීක්ෂණ දිනය 2018.03.15 වැනි දින ලෙස සංශෝධනය කරන ලද බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ප්‍රාදේශීය ලේකම්,
තිහගොඩ.

03-170

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.